# බොරැල්ල සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය සම්බන්ධයෙන් පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඒ.එම්.සී. සෙව්වන්දි[1]

මුඛ්‍ය පදඃ කතෝලික දේවස්ථාන, ගෘහ නිර්මාණ ශිල්පය, කොළඹ දිස්ත්‍රික්කය, පුරාවිද්‍යාත්මක උරුමය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කතෝලික ආගම විධිමත්ව ව්‍යාප්ත කිරීම ආරම්භ වනු ලබන්නේ යුරෝපීය යටත් විජිතකරණය සමඟිනි. ඇතැම් මූලාශ්‍රවලට අනුව පළමු සියවසේ දී ශුද්ධ වූ තෝමස් අපෝස්තුළුතුමා ශ්‍රී ලංකාවට පැමිණ සුභ ආරංචිය ප්‍රචාරය කළ බවට මත පළවී ඇත (ගෝම්ස්. ඕ, 2012). මෙහි දී කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ලෙහි පිහිටි සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත. කොළඹ දිස්ත්‍රික්කය වැදගත් වීමට හේතු ලෙස යටත් විජිත පාලනයේ කේන්ද්‍රස්ථානය වීම හඳුනාගත හැකිය. පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය යන සියලුම යටත් විජිත පාලකයන්ගේ පරිපාලන හා දේශපාලන කේන්ද්‍රස්ථානය ලෙස එවකට කොළඹ නගරය ක්‍රියාත්මක විය. (සෝමරත්න, 2012) තව ද ආගමික බලපෑමේ මූලාරම්භය ලෙස මෙහි පිහිටීම වැදගත් වේ. කොළඹ වරාය හරහා යුරෝපීය ජාතීන් පැමිණීමත් සමඟ කතෝලික ආගමික කටයුතු මුලින්ම ව්‍යාප්ත වීමට පටන් ගත් ප්‍රධාන භූමිය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය හඳුනාගත හැක. දිවයිනේ පැරණිතම සහ විශාලතම කතෝලික දේවස්ථාන කීපයක් කොළඹ ආශ්‍රිතව පිහිටා ඇත. මෙහි දී සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය, බොරැල්ල වැදගත් වේ. මෙම අධ්‍යනයේ ප්‍රධාන පර්යේෂණ අරමුණ වන්නේ මෙම දේවස්ථාන සම්බන්ධ අංගවල කාලානුරූපීව සිදු වී ඇති වෙනස්කම් අධ්‍යයනය කිරීම වේ. මෙහි දී දේවස්ථානයේ ඉතිහාසය, ආරම්භය, සහ කාලයත් සමඟ සිදු වූ පරිණාමය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කර ඇත. දේවස්ථානයේ ශෛලිය (උදාඃ ගොතික්, බැරොක්, නූතන) දේවස්ථානයේ අභ්‍යන්තර හා බාහිර අවකාශයන් සැකසී ඇති ආකාරය, අල්තාරය, ජනේල්, ප්‍රධාන දොරවල්, පිළිම, සීනුව වැදගත් වේ. මෙම දේවස්ථානය කොළඹ දිස්ත්‍රික්කයේ කතෝලික ප්‍රජාවට සහ සමස්ත සමාජයට සංස්කෘතික, ආගමික හා සමාජීය වශයෙන් විශාල දායකත්වය සිදු කර ඇත. කාලයත් සමඟ මෙම දේවස්ථානය නඩත්තු කර ඇති ආකාරය සහ ඒවායේ මුල් ස්වරූපය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති පියවර ආදිය ද වැදගත් වෙයි. මෙවැනි අධ්‍යනයන් මඟින් කොළඹ දිස්ත්‍රික්කයේ කතෝලික දේවස්ථානවල වාස්තු විද්‍යාත්මක

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chethanasewwandi00@gmail.com

උරුමය පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබාගත හැකි අතර, එය අනාගත පරම්පරාවන් සඳහා සංරක්ෂණය කිරීමේ වැදගත්කම ද අවධාරණය කරයි.

## ක්‍රමවේදය

කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ලේහි ස්ථාන ගතව ඇති කතෝලික දේවස්ථානක් වන සියලු ශාන්තිවරුන්ගේ දේවස්ථානය පිළිබඳව මෙහි දී පර්යේෂණය සිදු කර ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද කතෝලික දේවස්ථානක් ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක සිදුකරන ලබන පර්යේෂණය නිබන්ධය සකස් කිරීමේ දී ගුණාත්මක දත්ත රැස්කර ගැනීමේ ක්‍රමවේදය උපයෝගී කරගෙන ඇත.

මෙහි දී දත්ත රැස්කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර නිරීක්ෂණ යන ක්‍රමවේදයන් භාවිතයට ගෙන ඇත. එමෙන්ම පුස්තකාල භාවිතය, පර්යේෂණ ලිපි, ග්‍රන්ථ, අන්තර්ජාල භාවිතයට සිදු කරන ලදී. මෙහි දී තෝරාගත් දේවස්ථානය හා මෙම කතෝලික ආගම සම්බන්ධයෙන් රචනා කර ඇති ග්‍රන්ථ ලිපි ලේඛන එමෙන්ම අන්තර්ජාල ඔස්සේ මෙම අධ්‍යයන මාතෘකාව සම්බන්ධයෙන් දක්නට ලැබෙන දත්ත ලබාගෙන ඇත. ඒ අනුව අධ්‍යයනය කරනු ලබන ස්ථානයට ගොස් ඡායාරූප ලබා ගන්නා ලදී. ඒ අනුව ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණය හා සංසන්දනය කර අවසාන නිගමනයන්ට එළඹී ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම අධ්‍යයනය තුළින් මෙම කතෝලික දේවස්ථානය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කම පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගත හැකිය. බොරැල්ලේහි පිහිටා ඇති සියලු ශාන්තුවරුන්ගේ දේවාස්ථානය ලංකාවේ කතෝලික ජනතාව හට ඉතාමත් වැදගත් දේවස්ථානයක් ලෙස හඳුනාගත හැකි ය. මෙම දේවස්ථානය ගොතික් ශෛලියට අනුව නිර්මාණය කර ඇත. දේවස්ථානයහි ජනේල් සඳහා පැල්ලම් සහිත වීදුරු භාවිත කර ඇත. එම ජනෙල් දේවස්ථානය සඳහා විශේෂිත වෙයි. මෙම අධ්‍යනයෙහි ප්‍රධාන අරමුණ ලෙස මෙම දේවස්ථානයෙහි සම්බන්ධ අංගවල කාලානුරූපීව සිදුව ඇති වෙනස්කම් හඳුනා ගැනීමේ දී මෙම දේවස්ථානයෙහි දකුණුපස පිහිටි පැල්ලම් සහිත ජනෙල් වල කාලානුරූපී වෙනස්කම් සිදු වී ඇත. එහි දී දේවස්ථානයට ඇතුළු වන විට ශාලාවේ දකුණු පැත්තෙහි හතරවෙනි ස්ථානයේ පිහිටි ජනේලය නිර්මාණ කර ඇත්තේ ලංකාවෙහි වීම විශේෂිත වෙයි. එය ලංකාවේ දී ලබාගත් ද්‍රව්‍ය භාවිත කර ඇති අතර දේශීය නිර්මාණ ශිල්පීන් විසින් ඒවා නිර්මාණය කර ඇත. එබැවින් එහි ගුණාත්මක බව අඩු වන අතර එහි තොරතුරු දක්වා ඇත්තේ අඩුවෙනි. මෙහි වැදගත් අංගයක් වන අල්තාරය ආරම්භයෙහි කිරිගරුඬින් නිර්මාණය කර ඇත. මෙම අල්තාරයෙහි මුල් කාලයේ රන් ආලේපිත තහඩුවෙන් සාදන ලද පිළිමයක් පැවති ඇති අතර පසු කාලයේ එයට නව කලා නිර්මාණ, චරිත ඇතුළත් කර ඇත.

සමාලෝචනය

ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් කතෝලික දේවස්ථානයක් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය මඟින් හෙළි වන්නේ, මෙම ස්ථාන හුදෙක් ආගමික මධ්‍යස්ථාන නොව, ශ්‍රී ලංකාවේ යටත් විජිතකරණ ඉතිහාසය, සංස්කෘතික විවිධත්වය සහ වාස්තු විද්‍යාත්මක පරිණාමය පිළිබඳ ජීවමාන සාක්ෂි බවයි. මෙම ස්ථානවල ඇති පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම මඟින් අපට අතීත සමාජ, ආර්ථික හා දේශපාලනික තොරතුරු පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගත හැකි වීම විශේෂ වේ.

ආශ්‍රිත මූලාශ්‍රය

සෝමරත්න, ජී.වී.පී. (1991). ***ලංකා ඉතිහාසයේ ක්‍රිතානු යුගය.*** කොළඹ: විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා දේශපාලන විද්‍යා අංශයේ ප්‍රකාශනයකි.

සෝමරත්න, ජී.වී.පී. (1982). ***ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ආගම.*** නුගේගොඩ: දීපානී මුද්‍රණ ප්‍රකාශකයෝ.

බස්නායක, එච්.ටී. ***ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය -3 (ඉංග්‍රීසි පාලනය සමය).*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඔස්වල්ඩ්, ගෝමිස්, අගරදගුරු. (2012). ***කතෝලික යටිකියාව.*** කොළඹ: කතෝලික ප්‍රකාශන කේන්ද්‍රය.